# කිරිඅම්මා දානය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යනයක්

(ගම්පහ දිස්ත්‍රික්කයේ කොරසේ ගම්මානය ඇසුරින්)

එන්.එස්.යූ නැලිගම

පුරාවිද්‍යාව හා උරුම කළමණාකරන අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Sajirauneligam@gmail.com

**ප්‍රමුඛ පද:කිරි අම්මා, පතතිනි මෑණියන්, කිල්ල, ශාන්ති කර්මය**

## හැඳින්වීම

ස්වාභාවික විපත්, සත්ව උවදුරු, ලෙඩරෝග සේම තම පවුලට, ගමට, රටට සක්‍රිකත්වය, සෞභාග්‍ය පතා විවිධ ශාන්තිකර්ම, යකදරුකම්, බලිතොවිල්, වෙදකම් ආදිය සිදු කිරීම මෙ රට සමාජ ක්‍රමය තුළ මුල් බැසගෙන ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් අද දක්වාම මානවයා තම අරමුණු සඵල කරගැනීම උදෙසා යක්ෂ, දේව, නාග ආදීන්ට පුද පූජා පැවැත්වීම සිදු කරනු ලැබ තිබේ. එම ඇදහිලි විශ්වාස අතර සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ දැකිය හැකි කිරිඅම්මාවරුන් මූලික කරගත් පුද පූජා විශේෂයෙන් කැපී පෙනේ.

කිරි අම්මා මෙරට ජන සමාජය තුළ සංස්කෘතිය තුළ ගෞරවනීය චරිතයකි. සාම්ප්‍රධායික උඩරට සමාජයෙහි ව්‍යවහාරික ඥාති පද මාලාවන්ට අනුව කිරි අම්මා වන්නේ මවගේ හෝ පියාගේ මෑණියන්ය. පහතරට ඥාති පද මාලාවෙන් එම තනතුර ආච්චි වූවත් සාම්ප්‍රධායික උඩරට පවුල තුළ පැරණි පවුලේ ආදීතම ඥාතිවරිය ලෙස සැලකෙන්නේ කිරි අම්මාය.

පත්තිනි මෑණියන්ගේ පිහිට ආරක්ෂාව ලබාගැනීම සඳහා කිරි අම්මාවරුන් වෙත දෙනු ලබන මෙම දානය ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල විවිධ ආකායෙන් සිදු කරනු ලබයි. ඒ අනුව මෙම පූජාව ගම්පහදිස්ත්‍රික්කයේ කොරසේ ගම්මානයේ සිදුකරන ආකාරය අධ්‍යනය කිරිමට මෙම පර්යේෂණය සිදු කර ඇත. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයට අයත් කොරසේ ග්‍රාමය දීර්ඝ කාලීන ඉතිහාසයක් සහිත උඩුගම්පොල ප්‍රාදේශීය රාජධානිය තුළපිහිටි ගම්මානයකි. ගම්මානයේ නිවෙස්වල පවත්වනු ලබන කිරි අම්මා දානය සම්බන්ධ පුරාවෘර්තය, එහි සමාජ සංස්කෘතික වැදගත්කම, දානයේ විවිධ අවස්ථා හා ගායනා කරන කවි අධ්‍යනය කිරිම මෙහි මුඛ්‍ය අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සිදු කිරිමේ දී දත්ත රැස් කිරිම, විශ්ලේෂණය හා ඉදිරිපත් කිරිම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුක සාකච්ඡා,ඡායාරූප ගත කිරිම හා වීඩියෝ ගත කිරිම ආදි පර්යේෂණ ක්‍රමවේද යොදා ගන්නා ලදි. දත්ත සාහිත්‍ය මූලාශ්‍ර සමග සංසන්දනය කරමින් විශ්ලේෂණය කිරිම ද මෙම පර්යේෂණයේ දී සිදු කලේය.

## සාකච්ඡාව හා ප්‍රතිඵල

විල්ලෝඩි දේශයේ උඩයක්කු නමින් ප්‍රසිද්ධ සාදි යකුන් හත් දෙනාගේ බිසවුන් ලෙස සලකන කිරි අම්මාවරු රුවල්

නැවකින් සමන්කුළු පව්ව දෙසට ගමන්කර වලවේ ගංගාවේ රත්මුතු ඇල්ලේ දිය නාමින් සිටිනා විට රොඩියකු එක් බිසවකගේ අතින් ඇල්ලූ පිළිකුලෙන් ඇය දියට පැන දේවත්වයට පත්වූ බවපුරාවෘර්තයෙහි දැක්වේ. වර්ෂයක් පාසාම කිරි අම්මාවරු සත්දෙනා සිහි කරමින් පත්තිනි දෙවිදුන් විෂයෙහි කිරි අම්මා දානයක් දීමෙන් තම ජීවිතය යහපත් අයුරින් ගත කිරීමට අවශ්‍ය පරිසරයක් ගොඩනගා ගැනීමට ගැමියන් අපේක්ෂා කෙරේ. ජන ජීවිතයට වඩා සමීප දෙවඟනක් ලෙස සැලකෙන පත්තිනි මෑණියන් උදෙසා කිරි අම්මා දානයක් ලබාදීම තුළින් ගැබිනි මව්වරුන්ට, කුඩා දරුවන්ට යහපත පිහිට ආරක්ෂාව ප්‍රාර්ථනා කිරීම, විවිධ ලෙඩරෝග, අමනුෂ්‍ය දෝෂ, අපල උපද්‍රවවලින් වැලකීම, සෙත, සතුට, සශ්‍රිකත්වය, සෞභාග්‍ය ලබාගැනීම ආදිය බලාපොරොත්තු වේ.

උපන් මෙ දරුපල සපල කරනවා

දෙතන පුරා කිරි එරවා දෙනවා

නිතින් මෙ දුන් පුද දිවස් ලබනවා

රිද්දි බිසව දරුගැබ රැක දෙනවා

කිරි අම්මා දානය ඉතා උදාර පිංකමක් වුවද ඉතා සරළ දානයක් වන බැවින් ඊට අවශ්‍ය ආහාරපාන බඩු භාණ්ඩ සපයා ගැනීම ඉතාම පහසුය. එහෙත් සම්ප්‍රධායට අනුව කිරිබත්, කිරිකැලි, ඇඹුල් කෙසෙල් ගෙඩි, කැවුම්, හකුරු, කිරි, පළතුරු, කැඹිලි, පඩුරු හා පූජා භාණ්ඩ යනාදිය පිළියෙල කර ගනු ලැබේ. එසේම මැටි පහන්, පහන් තිර, පොල්තෙල්, කපුරු පෙති, කෙසෙල් කොළ, මල් හා බුලත් ද සපයා ගත යුතු වේ. පූජා භාණ්ඩ ලෙස කිරි අම්මාවරුන්ට පරිහරණයට සුදුසු සුදු රෙදි, සබන්, ඇඳ ඇතිරිලි, තුවා, කිරි පැකට්, ආදිය පිරිනමනු ලැබේ. හැකියාව පවතී නම් පඩුරු ලෙස මුදල් පරිත්‍යාගයක්ද ලබා දෙයි.

කිරි අම්මාවරුන් උදෙසා දානයක් දීමට පෙර පත්තිනි දෙවියන්ට බාර විය යුතුය. මේ සදහා බාරවන ආකාරය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන අතර මෙම ගම්මානයේ මූලික ලෙස දානයක් දීමට බලාපෙරොත්තු වන නිවැසියන් විසින් බලාපොරොත්තු වන අදාළ කාරණය පිළිබඳ සිතා පඩුරු ගැට ගසා බාරවීම සිදුකෙරේ. දානයක් දීමට පෙර කල් තියා පේවීම එනම් කිල්ලෙන් ආරක්ෂා වීම සිදුකරයි. මල්වර කිල්ල, මරණ කිල්ල වැදූම් කිල්ල, මාස් කිල්ල ආදි කිලිවලින් සේම මස්මාංශ අනුභවයෙන් ද වැලකී දානය සඳහා පේවීමට නිවැසියන් වග බලාගනී. දානය සඳහා කිරි අම්මාවරුන් තෝරා ගැනීමේ දී දැනට කිරි දෙන අම්මාවරුන් සේම දරුවන් උස්මහත් කර සිටින කිරි අම්මාවරුන් හටද බේදයකින් තොරව බුලත් කොලයක් දි දානයට ආරාධනා කරනු ලබයි. මෙහි දී යහපත්, ගුණගරුක, සිල්වත් අම්මාවරුන්ට ආරාධනා කිරිම සිදුකෙරේ.

දානයට ආරාධනා කිරිමේ දී තමන් කිල්ලකට හසු වී ඇතිනම් දානයට පැමිණීම ප්‍රතික්ෂේප කිරීමට කිරි අම්මාවරු වගබලා ගනී. යම් හෙයකින් තමන් දානයක් බාරගත් නමුදු හදිස්සි කටයුත්තක් නිසාවෙන් දානයට යාමට නොහැකි නම් තම හිඩස පිරවීමට වෙනත් කිරි අම්මා කෙනෙකුට තමන් විසින් ආරාධනා කිරීම සිරිත වේ. බදාදා හෝ සෙනසුරාදා වැනි කෙම්මුර දිනක මෙම දානය පවත් වන අතර අදාළ දින අලුයම් කාලයේ දානය සඳහා ආරාධනා ලැබූ කිරිඅම්මාවරු දානය පැවැත්වෙන නිවසේ කඩුල්ල ළගට පැමිණ කවියකින් මෙසේ සඳහන් කරයි.

පිරිසිදු පිරුවට ඇද පේ වෙන්නේ

දානෙට සත්දෙන එන බව දන්නේ

පත්තිනි දෙවියොත් සමඟ වඩින්නේ

කඩුල්ල ගාවට ඇවිත් සිටින්නේ

ඒ කවි ගායනා කිරීමෙන් අනතුරුව කිරි අම්මාවරුන්ගේ කණ්ඩායමේ කිරි දෙන මවක් පෙරටු කරගනිමින් කිරි අම්මාවරුන් නිවසට දෙසට පැමිණෙන අතර නිවසේ කාන්තාවක් විසින් දොරටුව අසල දෙහි කැබලි දැමූ බඳුනින් පා සෝදනු ලැබේ. අනතුරුව නිවසේ දොරටුවෙන් ඇතුලු වීමෙන් පසුද කවි ගායනා කිරීම සිදු කරයි.

පළවෙනි මංසල කවුදසිටින්නේ

නාථ දෙවියෝ සහ පිරිවර ඉන්නේ

කිරි අම්මාවරු ඇවිත් සිටින්නේ

ඇතුළට එන්නට අවසර දෙන්නේ

නිවැසියන් විසින් අසුනක් සකසා ඒ මත බුදුරදුන්ගේ හා පත්තිනි මෑණියන්ගේ රූප තබා ඇත. බුදුරදුන් විෂයෙහි මල්, සුවඳදුම්, ගිලන්පස ආදිය ද පත්තිනි මෑණියන්ට කැවිලි හා පළතුරු හත බැගින් යුත් පූජාවන් ද මල්, සුවඳදුම් ආදියද පූජා කරනු ලැබේ. ඉන් අනතුරුව සුදු රෙදි ඇතිරූ අසුන්වල කිරි අම්මාවරු අසුන් ගන්නා අතර එහි දී නිවැසියන් විසින් සුවඳදුම් හා කහ දියර ඉසිනු ලබයි. පසුව කිරි අම්මාවරුන් හට දානය පිරිනමනු ලැබේ. එහිදී කැවිලි හත බැගින් පූජා කිරීම සේම කිරි අම්මාවරු හතක් වීම සුවිශේෂි වන අතර ඊට හේතුව පත්තිනි දේවිය හත් වාරයක් ඉපදුනු බවට ඇති විශ්වාසය බව පිළිගැනේ.

දානය පිරිනැමීමෙන් අනතුරුව සියලුදෙනා එකතුව බුදුන් නැමදීම සිදු කරන අතර පසුව දානය දීමේ අරමුණු ප්‍රකාශයට පත් කර පත්තිනි මෑණිය උදෙසා වූ බාරයෙන් නිදහස් කිරීම සිදුකරයි. අනතුරුව කිරි ඉතිරවීම හා පත්තිනි දේව කන්නලව්ව ද දෙළොස්මාසය සඳහා වෙන වෙනම කවි කියමින් සෙත් පැතවීමද සිදු වේ.

එර්දි වෙලා උඩු ගුවනේ උඩින්නේ

එර්දි සලුව ගෙන පවන් සලන්නේ

සුද්ද ඇතිව දෙන දන් පිළිගන්නේ

සිද්ධ පතිනි දෙවි මෙපින් ලබන්නේ

පසුව දෙවියන්ට පිං පමුණුවා ලීම හා දානය ඉදුල් කරමින් ස්වල්පයක් අනුභව කිරීම සිදු වේ. ඉන්පසු කිරි අම්මාවරු දැල්වෙන පහන්වලින් තෙල් බිඳක් ගෙන හිසෙහි ගැල්වීම හා අඹ අතු කැබැල්ලකින් නිවැසියන්ට ආශිර්වාද කිරීම සිදුකෙරේ. ඇතැම් නිවෙස්වල පොල් ගෙඩියක්ද මෙහිදී බිඳිනු ලැබේ. ඉහත කී වතාවත් සිදු කිරීමෙන් අනතුරුව කිරි අම්මාවරුන් හට වැඳ නමස්කාර කොට තමන්ට හැකි ආකාරයට පූජා භාණ්ඩයක් පූජා කරයි. අවසානයේ ලැබූ දානයද රැගෙන කවි ගායනා කරමින් කිරි අම්මාවරු පිටත් වේ.

හත්වෙනි මංසල කවුද සිටින්නේ

සත් පත්තිනි දෙවියෝ වැඩ ඉන්නේ

කිරි අම්මාවරු යන්න හදන්නේ

එළියට යන්නට අවසර දෙන්නේ

මෙසේ කවි ගායනා කර කිසිවක් කතා නොකර පිටත් වන කිරි අම්මාවරුන්ගෙන් අවසානයට ගමන් කරන කිරි අම්මා දොර ඉදිරිපස ඇති ජලය දමා ඇති කලය බිමට හලා හිස් කරනු ලබයි. මෙමගින් නිවසේ වස් දොස් සෝදා හැරිය බවට සංකේතවත් වේ. කිරිඅම්මාවරුන්ගේ දානය හැකි පමණින් බෙදා හදාගෙන අනුභව කිරීමෙන් විශාල ආනිසංසයක් ලැබෙන බවට ජනයා තුළ විශ්වාසයක් පවතී. එබැවින් අසල්වැසියන්, ඥාතීන් හට කැවිලි ද්‍රව්‍ය බෙදාදීමට ද නිවැසියන් වගබලා ගනී.

## නිගමනය

කොරසේ ගම්මානය ඇසුරින් සිදු කළ මෙම පර්යේෂණය තුළින් අනාවරණය වුයේ කිරි අම්මා දානය ප්‍රාදේශීය විවිධත්වයකින් යුක්ත වන බවයි. නිදසුන් ලෙස මෙම ප්‍රදේශයේ දී පඩුරක් ගැට ගසා බාරවීම සිදු වුවත් ඇතැම් ප්‍රදේශවල පොල් ගසක ගොක් කොළයක් ගැට ගසා එය වෙන් කර තබා දෙවියන්ට බාර වී එය ඉටු වූ පසු කිරි අම්මාවරුන්ට දානයක් දෙන බවට ප්‍රාර්ථනා කරයි. එසේම මාස තුනක් පමණ වූ කෙසෙල් ගසක අතු බැඳ එකී කෙසෙල් ගසේ කෙසෙල් කැන් ඉදවා කිරි අම්මාවරුන්ට දානයක් දෙන බව සිතා බාරවීම ද ඇතැම් ප්‍රදේශ තුළ සිදු කරයි. කිරි අම්මාවරුන් තෝරා ගැනීමේදීත් කුඩා දරුවන් සිටින මව්වරුන් සේම දරුවන් හදා වඩා උස් මහත් කර සිටින මව්වරුන්ටද බේදයකින් තොරව ආරාධනා කිරීමද සුවිශේෂීය. පෙරදින කිරි අම්මාවරුන්හට ආරාධනා කළ බුලත් කොළය රැගෙන දානයට පැමිණීමද මෙහිලා සිදු කරනු ලැබේ.

ඒ අනුව පෙනී යන්නේ කිරි අම්මා දානය නැමැති ගෘහීය ශාන්තිකර්මය මෙම ගම්මානයේ සමාජ ව්‍යුහය තුළ මුල් බැසගෙන තිබෙන සංස්කෘතියේ සුවිශේෂී බව ප්‍රකට කරන පූජාවක් වන බවයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරසේකර, දයා. (2014)***කිරි අම්මාවරු.***කොළඹ:ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලගමුව, ආරිය. (2015)***පත්තිනි දෙවියෝ ආදිවාසී කිරි අම්මලා සහ කිරිඅම්මා දානය.***අතුරුගිරිය: අමිල ප්‍රකාශකයෝ.

ගුණසේන, ඉන්ද්‍රා දේවිකා. (2004)***ශාන්තිය සහිත පත්තිනි පූජාව.***මොඩන් පොත් සමාගම.


## සම්මුඛ සාකච්ඡා


තුශාරිකා, ඩී, කොරසේ දී,2018/02/09 දින සිදු කළ සම්මුඛ සාකච්ඡාව

චන්ද්‍රා, කොරසේ දී,2018/02/09 දින සිදු කළ සම්මුඛ සාකච්ඡාව